*සැ. යු. -* 2025.08.29 වැනි දින පළ කරන ලද අංක 2452 *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,453 - 2025 සැප්තැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1090 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1089 - B 082717 — 5,403 (2025/09)
F 1 -

# පළාත් පාලන නිවේදන

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්තිය යටතේ කරනු ලබන විරෝධතා කැඳවීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ ඇති මාවත පූජාපිටිය සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8.1 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව 2025 වර්ෂයේ ජූලි මස 08 වන මහ සභාවේ තීරණ අංක ඉ 1.5 යටතේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් මෙම මාර්ගයට අදාළ ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් යම් විරුද්ධත්වයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම 1987 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.


මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

සභාපති,<br>
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,<br>
පූජාපිටිය.

2025 අගෝස්තු මස 12 වැනි දින,<br>
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

1. මාර්ගයේ නම - අලවත්ත පේරකැලේ මාර්ගය
2. ආරම්භය - එම්. ජී. එන්. ජයසූරිය නැමැති අයගේ ඉඩම
3. අවසානය - එම්. ජී. ජයතිස්ස නැමැති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරී වසම - අලවත්ත - 538
5. පිඹුරු අංකය - 26812

| | *වම්පස* | | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|---|---|
| 01. | එම්. ජී. එන්. ජයසූරිය | 01. | එම්. ජී. ආරියදේව | 2150 Km | 2.4 m |
| 02. | එම්. ජී. බී. විමලරත්න | 02. | ඩබ්. ජී. ජයවික්‍රම | | |
| 03. | එම්. ජී. එන්. ජයසූරිය | 03. | ඩබ්. ජී. තිලකරත්න | | |
| 04. | එම්. ජී. විමලසිරි | 04. | කාන්ති රාජපක්ෂ | | |
| 05. | එම්. ජී. එස්. කේ. විජේරත්න | 05. | ඩබ්. ජී. විජේසිංහ | | |
| 06. | ඩී. ජී. මුතුමැණිකේ | 06. | එම්. ජී. සිරියාවතී | | |
| 07. | එම්. ජී. එන්. ආරියවතී | 07. | එම්. ජී. ජයතිස්ස | | |
| 08. | එම්. ජී. ජයවික්‍රම | | | | |
| 09. | ඩබ්. ජී. ඒ. දසනායක | | | | |
| 10. | එම්. ජී. සිරිවර්ධන | | | | |
| 11. | එම්. ජී. කීර්තිසිංහ | | | | |
| 12. | එම්. ජී. එස්. ඉන්ද්‍රජිත් | | | | |





| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.1995 | 0 | 1 | 78.88 | Road |

1. මාර්ගයේ නම - ගමේ ගුරු මාර්ගය
2. ආරම්භය - ජේ. රෝෂානා නැමැති අයගේ ඉඩම
3. අවසානය - ජී. එච්. ඒ. රසාක් නැමැති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරි වසම - මුල්ලේගම දකුණ අංක - 553
5. පිඹුරු අංකය - 25902

| | *වම්පස* | | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|---|---|
| 01. | ඉසෙඩ්. ඒ. එෆ්. මොහොමඩ් | 01. | අයි. රොෂානා | 110 m | 3.0 m |
| 02. | ජී. එච්. ඒ. රෂාන් | 02. | ජී. එස්. එම්. නසාර් | | |
| | | 03. | පී. ඒ. එම්. අස්ලාම් | | |

C.S.Liyanage (M.S.I)
Registered Licensed Surveyor
Court Commissioner & Valuer
Reg. No: 19700573

PLAN No: 25902




Scale 1:1000

# PLAN

of

An allotment of land marked lot 1 being portion of

"DODANGASPITIYE WATTA" alias "WAGOLLETENNE WATTA" alias "ANDENIYE WATTA"

Situated at

Mullegama Villege Mullegama South(553) G.N.Division

(Withing Pujapitiya Secretarial Division & Pradeshiya Sabha Limits)

in Pallegampaha of Harispattu

KANDY DISTRICT

C E N T R A L P R O V I N C E.

Entire land bounded as described above Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.0415 | 0 | 0 | 16.41 | Min.10 Feet wide Road |

Boundaries pointed out by owners of the lands
Surveyed on 03-FEB-2024

**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව**

ගෝ ඝාතක ආඥාපනත 272 වන අධිකාරිය යටතේ විරෝධතා කැඳවීමයි

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 2025 වර්ෂයේ සිට ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු සඳහා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් 2කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරිය අංක 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ගව ඝාතකාගාරය ඉදි කරනු ලබන ස්ථානය* |
|---|---|---|
| එම්. එච්. එම්. රියාස්,<br>නො. 50,<br>ඇතුන්ගහකොටුව | ගෝ ඝාතකාගාරය | එම්. එච්. එම්. රියාස් මයාට අයිති මඩුලැන් පාර, ඇතුන්ගහකොටුව ලිපිනයෙහි පිහිටි ඉඩම |

ජේ. ඒ. නිහාල් ජයසිංහ,
සභාපති,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 27 වැනි දින.

09-25

---

**කෑගල්ල මහා නගර සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන(සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තිය යටතේ කෑගල්ල මහා නගර සභාවට ලැබී ඇති බල ප්‍රකාර 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ ගරු පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කර 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/17 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව, 1990 අගෝස්තු මස 16 වැනි දින සබරගමුව පළාත් සභාවේ කියවා සම්මත කර ගන්නා ලද බවට 1990 දෙසැම්බර් මස 27 වැනි දින අංක 642/10 දරන IV(අ) වැනි කොටස පළාත් සභා අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 1 සිට LVII වැනි කොටස දක්වා සියළුම කොටස් ඒ අයුරින්ම පිළිගැනීමටත්, වැළඳ ගැනීමටත්, ක්‍රියා කිරීමටත් 2025 අගෝස්තු මස 06 වැනි දින අංක 2025/08/06/ඉ/01 දරන සභා සම්මුතියෙන් කෑගල්ල මහා නගර සභාව විසින් අනුමත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ජී. නිමල් කරුණාරත්න.
නගරාධිපති,
කෑගල්ල මහා නගර සභාව.

2025 අගෝස්තු මස 26 වැනි දින,
කෑගල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

09-22

**බදුල්ල මහා නගර සභාව**

2025 වර්ෂයේ පරිපූරක අයවැය ලේඛනය

මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරිය) 214(ආ) වගන්තිය ප්‍රකාර බදුල්ල මහා නගර සභාවේ 2025 මුදල් වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද පරිපූරක අයවැය ලේඛනය මහජන පරීක්ෂාව සඳහා කාර්යාල වේලාවන් තුළ 2025 සැප්තැම්බර් මස 02 වැනි දින සිට සැප්තැම්බර් 12 දින දක්වා බදුල්ල මහා නගර සභාවේ සෙනරත් පරණවිතාන මහජන පුස්තකාල පරිශ්‍රයේ සහ මහා නගර සභා කාර්යාලයේ දී තබා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නන්දන කැළුම්සිරි හපුගොඩ,
නගරාධිපති,
මහා නගර සභාව.
බදුල්ල.

2025 සැප්තැම්බර් මස 01 වැනි දින,
බදුල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

09-44

---

**ගාල්ල මහා නගර සභාව**

මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය යටතේ (252 අධිකාරය) කරනු ලබන දැන්වීමයි

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 04 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ තුන්වන වගන්තිය මගින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය ප්‍රකාරව (252 අධිකාරය) හා අංක 1980 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික) විධිවිධාන පනතේ 2(1) (අ) වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය ඉදිරියෙන් දක්වන පරිදි නම් කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. එම්. ටී. කේ. රත්නායක,
නාගරික කොමසාරිස්,
ගාල්ල මහා නගර සභාව.

මහා නගර සභා කාර්යාලය,
ගාල්ල.
2025

**උපලේඛනය**

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගය අලුතින් නම්කර ඇති නාමය* |
|---|---|---|---|
| අතුලනන්දාරාම පාර | වැලිපත හන්දිය | මාඉටිපේ II වන පටුමග | පූජ්‍ය කපුහෙම්පල අනුරවංශ නාහිමි මාවත |

.

09-41

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| සැප්තැම්බර් | 2025.09.04 | බ්‍රහස්පතින්දා | 2025.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.12 | සිකුරාදා | 2025.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.19 | සිකුරාදා | 2025.09.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.09.26 | සිකුරාදා | 2025.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |

එස්. ඩී. පාඩිකෝරාළ,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.